සුමින්දගේ කතා



සිසිර දිසානායක

සන්නස ජූනි කළාපයේ මෙම ලිපිය පළව තිබුණේ මුද්‍රණ දෝෂ කීපයක් සහිතවය. ඒ පිළිබඳව අපේ කණගාටුව ප්‍රකාශ කරමු. අදාල නිවැරදිකිරීම් සහිතව එය මෙසේ යළි පළකරමු.

පන්හිඳයි, පින්සලයි, පැන්සලයි එක වහලෙ යට උන්නට ඒ ඒ අයට මුණගැහෙන, ආස්සරේ කරන වෙනම කථිටියකුත් ඉන්නවා. ඒ මිත්‍රයින්ගෙන්, අහන්න, දකින්න, විඳින්න ලැබෙන දේ හරියටවත් තියෙනවා. ඒ සමහරක් දේවල් අනික් අය එක්ක බෙදා හදා ගන්නත් පන්, පින් වගේ ම පැන් අමතක කරන්නේ නෑ. ඒත් ඒ වගේ දේවල් ලියන එකනම් ටිකක් අඩුයි නේද කියලා පන්ට හිතුනා. මේ ළඟදි යාළුවෙක් කියපු කතාවක් හිතමට වගේ "සන්නස"ට ලියන්න පන් හිතුවා.

"මේ කතාව කියපු සුමින්ද නාතායක්කාර මිත්‍රයා ගැනයි වැඩිපුර ලියන්න ඕන" පන් ලියන්න පටන් ගත්තා.

"ඇත්තටම සුමින්ද අපූරු යාළුවෙක්. පුදුම විදියට පොත පත කියවන්නෙක්. සිංහල, ඉංග්‍රීසි භාෂා දෙකේම පොත් එක විදියට කියවන නිසා සුමින්දගේ දැනුමට විෂය වෙන පරාසය හරිම පළල්. ලැබෙන ඕනෑම පොතක් සුමින්ද කියවන්නේ බොහොම ඉක්මනින්. ලංකාවෙන් පොත් පෙට්ටි පිටින් ගෙන්නාගෙන ඒවා කියවනවා විතරක් නෙවේ, කිවන්න වැඩි කැමැත්තක් නැත්නම් වෙලාවක් නැති අයත් එක්ක ඒවා රසකර කර කියනවාත් එක්ක. හොඳ පොත් බෙදාහදා ගන්නත් හරිම උනන්දුයි. ලෝකයේ ඕනෑම රටක සිනමාව, නාට්‍ය ගැන පවා සුමින්ද දන්න දේවල් බොහෝමයි. ඒ නිසාම ඒ තුලින් සුමින්දට යම්කිසි දැක්මකුත් තියෙනවා. ඒ දැක්ම මහා නිර්මාණකාරයෝ විදියට තමන්වම හඳුක්වාගෙන අධි තස්සේරුවක ඉන්න අයගේ ඊතියා මතවාද වලට වඩා නම් හරිම ඉහළයි. ඒ වගේම ප්‍රබලයි. මොනවා වුනත් සුමින්ද මේ දේවල් කතා කරන්නේ නම් කීප-දෙනෙක් එක්ක විතරයි, වෙනත් විදියකට කිව්වොත් ඇත්තටම සුමින්ද ඒ අතින් හිඟඩයි. ඒ කතා කරන කීප දෙනෙක් අතරින් කෙනෙක් බවට පත් වෙන්න අපට වාසනාව ලැබිලා තියෙනවා." පන් තව තවත් ලිව්වා තමුන්ගේ මේ අපූරු මිත්‍රයා ගැන.

"මේ මොන දේ කළත් සුමින්දටත් බොහොම අවිංචිකයි. ඒ තමන්ගේ රස්සාව, ගේ දොර කටයුතු නිසා. මොනවා වුනත් අපේ සෑම දුරකථන පිළිසඳරක්ම පැයකට වඩානම් දිග වෙනවා. සුමින්දගෙන් දුරකථන පණිවිඩයක් ලැබුණම විදුලි පහන් තිවල ඇඳේ හාන්සිවෙලා ඒ පිළිසඳර වෙනුවෙන් ලෑස්තිවෙන්නේ තිව් සැනසිල්ලේ අර්ථවත් දෙයක් වෙනුවෙන් යෙදෙන කාලයක් ගත කරන්න ඕන තියයි. ඒ ගෙවන කාලය ඇත්තටම දැනුම බෙදා හදාගෙන අදහස් - මතවාද ඉදිරිපත් කරගෙන ජීවිතයට යමක් එකතු කරගන්න කාලයක්."

"මේ කතාවල් මේ තරම් දිග්ගැහෙන්න ප්‍රධාන හේතුවක් තියෙනවා. අප දෙදෙනාම කැමති - අකැමැති දේ, කියවන - හොයාබලන දේ, බොහෝ වෙලාවට එකම වෙන එකයි. ඒ.... ඒ නිසාම කතා කරන්න දේවල් ඕන තරම්. අපේ ඉතිහාසයේ සීතාවක රාජසිංහ රජ්ජුරුවො වගේම අපරදිග ලෝකයේ ලෙයනාඩෝ ඩාවින්චිලා අපේ වීරයෝ. අපේ නන්දා මාලිනි වගේ ගායිකාවන් වගේම අපරදිග ලෝකයේ "ඇබා"ලා "බැකාරා" වගේ අපේ ලෝකයේ ඉඟලින්ම වැඩඹෙන අය. කලාව, විද්‍යාව, ඉතිහාසය, පොත - පත සුමින්දගේ ප්‍රධාන මාතෘකාය. සුමින්ද අපේ ජන සංස්කෘතියටත් හරිම ආදරෙයි."

"සුමින්ද මෙල්බන් වල ඩැංඩිනොං ප්‍රදේශයේ ජීවත් වන ප්‍රේමා - ධම්මි කටුගම්පොල දෙපලගේ පුතා. ප්‍රේමා අක්කගෙයි ධම්මි අයියාගෙයි පුතා වන සුමින්ද අපට "සුමින්ද මල්ලි" වෙලා....! කටුගම්පල දෙපලගේ "මල්ලිව" සුමින්දට "අයියා" වෙලා !! ඒක වුනේ කොහොමද කියලා නම් හිතාගන්න අමාරුයි."

"අයියා දන්නවද වැඩක් ?" ඒ සුමින්ද කතාවකට මුලපුරන විදිය. ඒ විදියට මුලපුරන කතාවක "අයියට මං මරු කතාවක් කියන්නද ?" කියලත් අහනවා. යමක් හිතන්න දෙයක් තියෙන කතාවක්ම පටන් ගන්නේ එහෙම." මේ එහෙම කියපු එක කතාවක්.

"ඔන්න අයියා එක විශ්ව විද්‍යාලයක නීතියයි, තර්ක ශාස්ත්‍රයයි ඉගෙන ගන්න කොල්ලෙක් හිටියලු. සුමින්ද කතාවට මුලපුරපු විදියයි ඔය."

"මිනිහා දක්ෂයා. ඒ වුනත් ළඟ ළඟම තිබුණ විභාගයට පාඩම් කරන්න මිනිහට බැරිවුණා. ඉතින් මේ ශිෂ්‍යයා මොකද කරන්නේ, තමන්ට උගන්වන කථිකාචාර්යවරයා මුණගැහෙන්න ගිහින් ඇත්තම කිව්වා. පාඩම් කරන්න බැරිලැනත් ප්‍රශ්නවත්නම් උදව්වක් කරන්න කියලත් ඉල්ලුවා."

ගෝලයා දක්ෂයා හන්දා කථිකාචාර්වරයටත් දුක හිතුණා. එහෙම හිතිලා මෙහෙම යෝජනා-වක් ගෙනාවා. ශිෂ්-යයා කැමති ඕනම ප්‍රශ්න දෙකක් අහන්නත්, ඒ ප්‍රශ්නවලට උත්තර දෙන්න තමන්ට බැරි වුනොත් විභාග ප්‍රශ්න පත්තරේ කලින්ම ශිෂ්‍යයාට දෙන්නත් කථිකාචාර්යවරයා යෝජනා කළා. ශිෂ්‍යයත් එකඟ වෙලා ප්‍රශ්න දෙකක් ඇහුවා මේ විදියට....

"මම මේ කියන දේ නීත්‍යානුකූලයි. ; ඒත් තර්කානුකූල නැහැ. මොකක්ද ඒ ?" ශිෂ්‍යයාගේ ප්‍රශ්නයට කතිකාචාර්යවරයට උත්තර දෙන්න බැරිවුණා. ශිෂ්-යයා දෙවන ප්‍රශ්නයත් ඇහුවා.

"මම මේ කියන දේ තර්කානුකූලයි.. ඒත් නීත්‍යානුකූල නැහැ. මොකක්ද ඒ?" ඒ ප්‍රශ්නයටත් කථිකාචාර්යවරයාට උත්තර නෑ. ඒ වුනත් පොරොන්දුවේ විදියට ප්‍රශ්න පත්‍රය ශිෂ්‍යයාට දෙන්න කලින් උත්තර දෙක දැනගන්න කථිකාචාර්යවරයට ඕන වුනා." මෙන්න ශිෂ්‍යයාගේ උත්තර:

"වයස අවුරුදු හැටක් විතර වෙන ඔබතුමා වයස විස්සක විතර තරුණියක් විවාහ කරගෙන ඉන්න එක නීත්‍යානුකූලයි; ඒත් ඒක තර්කානුකූල නෑ."

"ඒ වගේම මගේ හොඳම යාළුවෙක් ඔබතුමාගේ තරුණ බිරිඳ යාළු කරගෙන ඉන්නෙක තර්කානුකූලයි. ඒත් නීත්‍යානුකූල නෑ. කථිකාචාර්යවරයා මුකුත් නොකියාම ශිෂ්‍යයාට ප්‍රශ්ණ පත්තරේ දුන්නා"

"විභාගයෙන් පස්සේ පැවැත්වෙන වාරයේ දේශණයකදී කථිකාචාර්යවරයා මේ ප්‍රශ්ණ දෙක අනික් ශිෂ්‍යන්ගෙන් ඇහුවා. ඒ වෙනකොට කාටවත් ඒක රහසක් නොවුන නිසා ළමයි ඔය උත්තර දෙක දුන්නා. ලැජ්ජාවට පත්වන කථිකාචාර්යවරයා ශිෂ්‍යයින්ට මේ විදියෙ අභියෝගයක් කළා. පුළුවන්නම් තමන්ට උත්තරයක් දෙන්න බැරි ප්‍රශ්නයක් අහන්න කියන එකයි අභියෙ-ාගය. ඒ පාරත් අර දක්ෂ ශිෂ්‍යයා ඉදිරිපත් වුණා."

"මම මේ කියන දේ නීත්‍යානුකූලත් නෑ... මොකක්ද ඒ ?" කථිකාචාර්යවරයාට අයෙමත් උත්තර නැතිවුණා. මෙන්න තුන්වෙනි ප්‍රශ්නයට දක්ෂ ශිෂ්‍යයා දුන්න උත්තරේ.

"ප්‍රශ්න දෙකකට උත්තර දෙන්න බැරිවුණාට විභාග ප්‍රශ්න පත්තරයක් එක ළමයෙකුට විතරක් කලින් පිටකරන එක නීත්‍යානුකූලත් නෑ. තර්කානුකූලත් නෑ" ශිෂ්‍යයා ඉතිරි රහසත් හැමෝම ඉස්සරහා එලි කළා. මරු ගෝලයෙක් නේද ?"

අපි ඇදේ උණුසුමට හාන්සි වෙලා මේ කතා ඇහුවට සුමින්ද මල්ලි අපිට මේ කතා අපිට කියන්නේ ගෙදරින් එලියට ඇවිත්. සීතලේ. කළුවරේ. හිටගෙනමයි. මේ කතා අතරේ හංගන්න හදන කැස්සකුත් වෙලාවකට ඇහෙනවා. පැය ගනන් කෙරෙන මේ කතා අතරේ සුමින්ද මල්ලි තමන්ගේ ශරීර සෞඛ්‍යය ගිණි පුළිඟුවක දාලා ගන්නවා. මේ කතාබහ අතරේ සුමින්ද මල්ලි තමන්ගේ ජීවිතයේ දුම් රැල්ලක පා කර හරින්න හදනවා. නේද කියලා හිතෙනකොට නම් හිතට ඇතිවෙන්නේ ලොකු කණගාටුවක්." පන්හිඳ ලියවිල්ල නතර කළේ මෙහෙම

"මේ වගේ අයගේ ජීවිත වැඩියෙන් වටින්නේ ඒ අයට නෙවෙයි; අනිත් අයට....!"

3 වන පිටෙන්

ජනාධිපතිවරයා ලෙස පත්වී ගතවූ මාසයක පමණ කාලය තුළ මෛත්‍රී ජනතාව හමුවේ කළ ප්‍රකාශ ඉතා ආකර්ෂණීය විය. ප්‍රජාතන්ත්‍රවාදය අපේක්ෂා කරන ජනයාගේ සිත් ප්‍රබෝධවත් කරන්නට හේතු විය. ඒවා අතර තමා රජෙකු නොව ජනතා සේවකයා වන බැවින් අතිගරු යන ඇමතීම් අවශ්‍ය නොවන බවට කළ ප්‍රකාශය, දූෂණය නාස්තිය පිටු දැකීම අත්‍යවශ්‍ය බව, ජාතීන් අතර සමගිය සංහිඳියාව ගොඩනොනගා රට ඉදිරියට යා නොහැකි බව, පක්ෂ අතර ගහමරාගැනීමේ දේශපාලනය පිටු දැක රට ගොඩනැගීමට වසර කීපයකට වත් සර්ව පාක්ෂික ආණ්ඩුවක් අවශ්‍ය බව, යහපත් දේශපාලන සදාචාරයක් ගොඩනැගිය යුතුය යන ප්‍රකාශ ඉතා වැදගත්ය. එසේ ප්‍රකාශ කරන අතර ජනාධිපතිවරයා සතුව තිබූ අසීමිත බලතල අත්හැරීමෙන්ද, අනවශ්‍ය වියදම් කපා හැරීමෙන්ද, අල්පේච්ඡ පැවැත්මෙන්ද බෙහෙවින් අගය කළ යුතු ආදර්ශයන් භාවිතයෙන් පෙන්වූයේය. 'කෝ ඉතින් හොරු ඇල්ලුවාද'යි කොරුම ඔව්වම පාද්දීත් අධිකරණයට සහ පොලිසියට ඇඟිලි නොගැසීමෙන් යහ පාලනය තහවුරු කිරීමේ වුවමනාව පෙන්වා සිටියේය. තමා බලයට පත්කිරීමට වෙහෙසුණු ලොකු කුඩා සියලු සංවිධාන මුණගැසෙමින් අදහස් විමසා බලන පිළිවෙතක් ආරම්භ කළ අතර මාධ්‍ය ඔස්සේ කෙරෙන විවේචන සහ යෝජනා කෙරෙහි සැලකිල්ලක් දක්වන බවක්ද පෙන්වීය.

එහෙත් අද සිදුවෙමින් පවතින්නේ ඒ යහපත් ගමනට හිරිංග දමා ගත් තත්වයකි. ඉදිරි මහ මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජයග්‍රහණය කරවීම වෙනුවෙන් ඉහත කී සියලු යහපත් දේ පරදුවට තබා තිබේ. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අය 'චුතලවෙලා පලයන් සිරිසේන' යයි අවලාද නගාදී තමා බලයට පත් කරන්නට කැපවී ක්‍රියා කළ එක්සත් ජාතික පක්ෂයට පිටුපෑම සඳාචාරමය වශයෙන් හිවැරදිද යන ප්‍රශ්නය නොඅසා තවදුරටත් ජනතා හයපතට කිසිවක් කළ නොහැකි යයි අත්හැර දමා පැමිණ පක්ෂය සහ පෙරමුණ යළි බලයට ගෙන ඒමෙන් යා හැකි ගමන කුමක්ද යන ප්‍රශ්නය අපි සෘජුවම ජනාධිපතිරයාගෙන් අසන්නෙමු.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම සමග ඔබ ලෝකයට ප්‍රකාශ කර ඇති ජාතික සංහිඳියාව ගොඩ නැගිය හැකිද? ඒ සඳහා සූදානමක් ඔවුන් පෙන්වා ඇත්ද?

ඒ කණ්ඩායම සමග නාස්තිය දූෂණය නැති පාලනයක් ගොඩනැගිය හැකිද? පසුගිය රාජපක්ෂ පවුල් පාලනය තුළ සිදුවී ඇති මහා පරිමාන දූෂණ නාස්ති සම්බන්ධයෙන් විරෝධයක් තබා අඩු වශයෙන් හිරිකිතයක් වත් පෙන්වන කී දෙනෙක් නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රී කණ්ඩායම තුළ සිටිත්ද? අප නම් දුටුවේ පසුගිය මාස පහ හය තුළ ඔවුන් පාර්ලිමේන්තු බහුතර බලය යොදා ගත්තේ වංචා දූෂණ පරීක්ෂණ වැළැක්වීමට, අඩපන කිරීමට මිස ඒවාට විරුද්ධව නොවන බවයි.

මේ මන්ත්‍රී කණ්ඩායම සමග එක්වී ජාතික සංහිඳියාව ගොඩනගන්නට හැකි වේ යයි ජනාධිපති තුමා විශ්වාස කරන්නේ නම් පසුගිය කාලය තුළ මෙයින් කී දෙනෙක් නම් එවැන්නක අවශ්‍යතාව වෙනුවෙන් පෙනී සිටියේ දැයි පෙන්වා දිය යුතුය. ඔවුන්ගෙන් අති බහුතරය අදත් සිටින්නේ ජාතිවාදය ඇවිස්සීමේ තම දෛනික දේශපාලනය කරගත් මහින්ද රාජපක්ෂ අගමැති පුටුවේ වාඩි කරවීම සඳහා දර දිය අදිමිනි.

රටේ ප්‍රධාන ප්‍රශ්න විසඳා ගැනීම සඳහා ජනාධිපතිවරයා යෝජනා කළ තාවකාලික සර්ව පාක්ෂික ආණ්ඩු සංකල්පයට මේ මන්ත්‍රී කණ්ඩායමේ කී දෙනෙක් නම් එකඟද? අපට නම් පෙනෙන්නේ එහි අති බහුතරය මෛත්‍රීගේ එම සංකල්පය විහිළුවක් ලෙස සැලකූ බවයි. මෑතකදී ජනාධිපතිවරයාගේ දේශපාලන උපදේශකයන් ලෙස පත්වීම් ලද දෙදෙනා ද අමතකම් දුන් අයගෙන් වැඩි දෙනාද ඒ අදහසට ඔව්වම් කළහ. ඔවුන් තම අදහසට නතු කර ගැනීම වෙනුවට මෛත්‍රී ද දැන් ඒ අදහස අත්හැර දමා ඇති බව පෙනේ. දැන් ඔහුද කතා කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් ගැනය.

මේ මන්ත්‍රී කණ්ඩායමේ කීප දෙනෙකු හැර අනෙක් සියල්ලෝම පසුගිය මාස කීපය තුළ කළේ මෛත්‍රීගේ ජයග්‍රහණය සමග බලයට පත්වූ ආණ්ඩුව කඩාකප්පල් කිරීම වෙනුවෙන් පාර්ලිමේන්තුවේ බහුතර බලය යොදා ගැනීමයි. හැකි තරම් කප්පාදු කර, නොකර බැරිකමට අනුමත කළ 19වැනි සංශෝධනයේ ප්‍රධාන අංග වූ ව්‍යවස්ථාදායක සභාව සහ කොමිෂන් සභා ක්‍රියාත්මක වීම වැළැක්වීමෙන් ප්‍රජාතන්ත්‍රවාදී ගමනට අඩ තබා ඇත. මේ කල්ලිය දිගින් දිගටම මගින්ද අගමැති වෙනවා යන මිථ්‍යාව වපුරාදීදී යළිත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයට පත්කි රීමක් ගැන ජනාධිපතිවරයා ද කතා කරන්නට වීම තුළ රාජ්‍ය පරිපාලන යන්ත්‍රය අක්‍රිය වීමක් සිදුවී තිබේ. පරණ ආණ්ඩුවම ඉක්මනින් යළිත් එනවා නම් 'අපි හිකං අත පුළුවා ගන්නේ මොකටද'යි නිලධාරීන් කල්පනා කරන්නට පටන් ගෙන තිබෙන බවක් පෙනේ. සමහර අධිකරණ තීන්දුවලින්ද මෙය පෙනේ. වංචා දූෂණවලට විරුද්ධ පරීක්ෂණවලටද මෙය අහිතකර ලෙස බලපා නැතැයි කිව නොහැකිය.

ජනාධිපතිවරයා දැන් කටයුතු කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම යනු රටේ ජනතාව යයි වැරදි වැටහීමකින් බවකි පෙනෙන්නේ. මේ කණ්ඩායම පසුගිය රාජපක්ෂ පවුල් පාලනය තුළ සිදුවූ සියලු වැරදි අනුමත කළ, බොහෝ දෙනෙක් ඒ වැරදිවලට සම්බන්ධ වූ අය බව ජනාධිපතිවරයාගේ ප්‍රතිරූපයෙන් මුවා කළ නොහැකිය. එසේ කරන්නට ජනාධිපතිවරයා ගේ සහාය ලබා දෙන්නේ නම් එයින් සිදුවන්නේ ඒ ප්‍රතිරූපය බිඳවැටීමය. මේ තරම් කෙටිකාලයක් තුළ එය බිඳවැටීම යනු ප්‍රජාතන්ත්‍රවාදය ගැන ජනතාව තුළ මහත් බලාපොරොත්තු දැල්වූ රාජ්‍ය නායකයකු ඉතා කෙටි කාලයක් තුළ සියතින් ගෙල වැල ලා ගැනීමක් වනු ඇත.